
<u>විජේසේකර යතුරු පුවරුව භාවිතා කරන  ආකාරය</u>

<u>**තීක්ෂණ R & D, ලංකා වසම් අධිකාරියේ සහයෝගිතාවයෙන් ඉදිරිපත් කරනු ලබයි**</u>

මෙම ලිපිය මගින් සිංහල අකුරු යතුරු ලියනය කිරීම සඳහා විජේසේකර යතුරු පුවරුව භාවිතා කරන ආකාරය පිළිබඳව මූලික හැඳින්වීමක් කර ඇත. පහත දක්වා ඇත්තේ විජේසේකර යතුරු පුවරු පිරිසැලසුමයි. - රූපය 01




*රූපය 01*

<u>විජේසේකර යතුරු පුවරුව භාවිතා කිරීමේ පියවර</u>

**1)** පළමුව, ඔබගේ පරිගණකයේ භාෂාව ලෙස සිංහල තෝරා ගත යුතුයි.

**2)** ඉන්පසුව සිංහල අකුරට අදාල වන, ඉංග්‍රීසි අකුරෙහි යතුර  තෝරාගෙන යතුරු ලියනය කල යුතුයි.

පහත දක්වා ඇත්තේ එවැනි උදාහරණ කිහිපයකි.

- සිංහල  - " සිංහල" යන වචනය සඳහා පහත පියවර අනුගමනය කල යුතුයි.

මෙහිදී, "සි"  සඳහා පිලිවෙලින් "i" සහ "s"  ද, " ං" සඳහා  "x" ද, " හ" සඳහා "y" ද "ල" සඳහා "<"  ද භාවිතා කල යුතුයි.

- පුවරුව  -  "පුවරුව" යන වචනය සඳහා පහත පියවර අනුගමනය කල යුතුයි.

මෙහිදී, "පු"  සඳහා පිලිවෙලින් "m" සහ "q"  ද, "ව " සඳහා  "j" ද, "රු" සඳහා "r" සහ "q"  ද "ව" සඳහා  නැවත "j" අකුරද භාවිතා කල යුතුයි.

**3)** මුර්ධජ අකුරු භාවිත කිරීමේදී එයට අදාල වන ඉංග්‍රීසි අකුර, යතුරු පුවරුවේ "Shift" (ශිෆ්ට්) යතුරත් සමඟ එකවර භාවිත කල යුතුයි.

පහත දක්වා ඇත්තේ උදාහරණ කිහිපයකි.

- ණය -  "ණය" යන වචනය සඳහා පහත පියවර අනුගමනය කල යුතුයි.

මෙහිදී “ණ” සඳහා “Shift” යතුර සමඟ “k” අකුර එකවර යතුරු ලියනය කල යුතුයි. “ය” සඳහා “h“ අකුර භාවිත කල යුතුයි

- ඒ ආකාරයට "ළ" සඳහා  “Shift” යතුර සමඟ “<”   එකවරද , "ෂ" සඳහා “Shift” යතුර සමඟ “i” එකවරද භාවිතා කල යුතුයි.

**4)** සිංහල සඤ්ඤක අකුරු යතුරු ලියනය කිරීමේදී අවශ්‍ය වන්නේ යතුරු පුවරුවේ "Space key" එකට දකුණු පසින් ඇති "Alt" යතුරයි.

පහත දක්වා ඇත්තේ උදාහරණ කිහිපයකි.

- එනම් මෙහිදී සඤ්ඤක "ඳ" යතුරු ලියන කිරීමට "Alt"  යතුරත් සමග "o" යතුර එකවර යතුරු ලියනය කල යුතුයි.

  ඳ → Alt  +   o

- "ඟ" යතුරු ලියන කිරීමට "Alt" යතුරත් සමග “.”යතුර එකවර යතුරු ලියනය කල යුතුයි

  ඟ → Alt + .